සැකසුම - එම්.ජී.ඒ.වී.කේ. ධර්මරත්න.
කලාප අධ්‍යාපන කාර්යාලය - නිවිතිගල.

<u>මාතෘකාව - සරල යන්ත්‍ර</u>

<u>පාඩම - චක්‍රය හා අක්ෂ දණ්ඩ (සක සහ අකර)</u>

* මෙම අධ්‍යයනය අවසානයේදී ඔබ,

- චක්‍රය හා අක්ෂ දණ්ඩ සරල යන්ත්‍රයක් බව ක්‍රියාකාරකමක් මගින් පෙන්වා දෙයි.
- චක්‍රය හා අක්ෂ දණ්ඩ වඩාත් වාසිදායක අයුරින් යොදාගත හැකි ආකාර සරල ක්‍රියාකාරකමක් මගින් පෙන්වා දෙයි.
- චක්‍රය හා අක්ෂ දණ්ඩ වඩා වාසිදායක අයුරින් භාවිතා වන අවස්ථා සඳහා නිදසුන් දක්වයි.

පළමුව 9 ශ්‍රේණිය පෙළ පොතෙහි ii කොටසෙහි පිටු අංක 95හි 15.3 කොටස කීපවිටක් කියවන්න.

ඉන්පසු 15.19 රූපය ඇඳ එහි කොටස් වන වකැටිය, සිලින්ඩරාකාර ලී කඳ, කඹය, බාල්දිය ආදිය නම් කරන්න.

ඉන්පසු 15.20 රූපය ඇඳ කොටස් නම් කරන්න.

- වකැටිය එක් වටයක් කරකැවෙන විට ආයාසය චලනය වන දුර, වටයක් කරකැවෙන වෘත්තයේ පරිධියට සමාන වේ.
- එවිට භාරය එසවෙන්නේ ලී කඳේ පරිධියට සමාන උසකට බව වටහා ගන්න.

දැන් 96 පිටුව හොඳින් කියවා,

1. එහි ඇති ගණනය කිරීම සිදු කරන්න.
2. චක්‍රය හා අක්ෂ දණ්ඩ යන්ත්‍ර වල ප්‍රවේග අනුපාතය පිළිබඳ පැහැදිලි කිරීමක් සිදු කරන්න.
3. චක්‍රය හා අක්ෂ දණ්ඩ යන්ත්‍රවල භාවිතා වන අවස්ථා ලියන්න.

** හැකිනම්, චක්‍රය හා අක්ෂ දණ්ඩ යන්ත්‍ර වල රූප කීපයක් එකතු කරන්න.